CEYLON BIRD CLUB

Sri Lanka - 1943

# ශ්‍රී ලංකාවේ කුරුල්ලන් සඳහා සිංහල නාමාවලිය

## තෙවන සංස්කරණය

**ලංකා කුරුලු සංගමය, 2026**

## හැඳින්වීම

ශ්‍රී ලංකාවෙහි, කුරුල්ලන් විනෝදාස්වාදය සඳහා නැරඹීම, ඔවුන් ඡායාරූප හා චිත්‍ර ගත කිරීම, සහ මෙම නිර්මාණ මාධ්‍ය ඔස්සේ පළකිරීම, මෑතක දී සිට වඩාත් ජනප්‍රිය වී ඇත. එමෙන්ම, කුරුල්ලන් විමසීමෙන් යුතුව නිරීක්ෂණය කිරීම ද, ඔවුන්ගේ හඬ ග්‍රහණය කිරීම ද, ඔවුන් විද්‍යාත්මක පදනමකින් අධ්‍යයනය කිරීම ද, මෙහි ප්‍රචලිත වෙමින් පවතියි.

කුරුල්ලන් සඳහා, ලොව පුරා භාවිත වන, සත්ව විද්‍යාත්මක නම් වලට අමතරව, ගෝලීය හා කලාපීය වශයෙන්, ඉංග්‍රීසි හා වෙනත් දේශීය බසින් නම් ඇති වුව ද, සිංහල නම් පෙළක අඩුව හා අවශ්‍යතාවය බොහෝ කලෙක සිට හඳුනාගෙන තිබුණි. මෙරට සියලු නිරීක්ෂකයින්, පහසු සහ ප්‍රායෝගික බැවින්, කුරුල්ලන් සඳහා ඉංග්‍රීසි නම් භාවිත කළ ද, අධ්‍යාපන හා රාජකාරී වැනි කටයුතු සඳහා, සිංහල නම් අත්‍යවශ්‍ය වේ.

1880 හි, බ්‍රිතාන්‍ය ජාතික වින්සන්ට් ලෙග් ලියූ, A History of the Birds of Ceylon නම් ග්‍රන්ථයෙහි සිට, පසුව විටින් විට පළ වූ, පොත්පත් රැසක ම, කුරුල්ලන් සඳහා එවිට දී භාවිත වූ සිංහල නම් සඳහන් වී තිබේ. එහෙත්, එකම නම වර්ග කිහිපයකට දැක්වීම, එකම වර්ගයකට නම් කිහිපයක් දැක්වීම, සහ ජන ජීවිතයට ඍජු සබඳතාවක් නැති කුරුලු වර්ග බොහෝ ගණනාවකට සිංහල නම් නිබැඳී නොතිබීම, වැනි ගැටලු රැසක් එවැනි ප්‍රයත්නයන් තුළින් මතු විය. මව් බස සිංහල නොවන කතුවරුන්ට තමා වෙත ලැබෙන සිංහල නම් පිරික්සිය නොහැකි වීම ද බාධකයක් විය.

1955 දී පළ වූ ජී. එම්. හෙන්රි ගේ A Guide to the Birds of Ceylon නම් ප්‍රකට ග්‍රන්ථයෙහි හැඳින්-වීමෙහි ද මේ අවශ්‍යතාවය සඳහන් වේ. ඩබ්. ඩබ්. ඒ. ෆිලිප්ස් තම A 1975 Annotated Checklist of the Birds of Ceylon නම් කෘතියෙහි සෑම කුරුල්ලකුටම සිංහල නමක් යෙදිය යුතු බව පෙන්වීය.

ඒ අනුව, ලංකා කුරුලු සංගමයේ එවක සිටි සභාපති තීලෝ හොෆ්මාන්, මේ කර්තව්‍යය, මෙරට කුරුල්ලන් පිළිබඳ හසළ දැනුමක් සතු වූ, ටී. එස්. යූ. ද සිල්වා සහ ඩග්ලස් රණසිංහ වෙත පැවරීය. ඔවුන් සැකසූ නාමාවලියෙහි, එකල රට තුළ භාවිතයෙහි වූ නම් 85 ක් එලෙසම යොදා ගැනීමට හැකි වූ බව ද, නම් කිහිපයක් භාවිත වූ තවත් වර්ග 101 කට එක් නමක් තෝරා ගැනීමට සිදු වූ බව ද, දක්වා ඇත. කිසිදු සිංහල නමක් තිබෙන වගක් සොයාගත නොහැකි වූ කුරුල්ලන් 242 ක් සඳහා එහි අලුතින්ම නම් යොදන ලදි.

මෙසේ, ප්‍රථම වරට, ක්‍රමානුකූලව, සැකසූ සිංහල නාමාවලිය ‘ශ්‍රී ලංකා කුරුලු නාමාවලිය’ / Sri Lanka Avifaunal List – (Sinhala-English) නමින්, 1978 දී ලංකා වනසත්ව සහ ස්වභාව ආරක්ෂක සංගමය හා ලංකා කුරුලු සංගමය විසින් පළ කරන ලදි. එහි ඉදිරිපත් වූ කුරුලු නම් ෆිලිප්ස් ගේ ඉහත සඳහන් කෘතියෙහි 1978 සංස්කරණයට එකතු විය.

1994 දී ඩී. පී. විජේසිංහ ගේ Checklist of the Birds of Sri Lanka නම් කෘතිය ලංකා කුරුලු සංගමය විසින් පළ කරන ලදි. ඉහත කී 1978 දී පළවූ මුල් සිංහල කුරුලු නාමාවලිය, මෙම කෘතියෙහි යොදන ලද සමකාලීන කුරුලු වර්ගීකරණය සහ අනුපිළිවෙළ අනුව යළි සකසා, මෙහි ඇතුලත් මෙරට ඒ අතර දී අලුතින් වාර්තා වූ කුරුලු වර්ග ද එකතු කොට, මුල් කතුවරුන් විසින්ම, නැවත සංස්කරණය කොට, 1994 දී පළ කරන ලදි. මින් පසුව සිංහල කුරුලු නාමාවලිය යාවත්කාලීන කරන අවස්ථා වල දී ඒ සඳහා මෙම නාමාවලිය පදනම වී ඇත.

1995 දී, ඉන් පෙර සිංහල නම් සැකසීමේ දී හඳුනාගත් ගැටලු නිරාකරණය කර, 1994 කුරුලු නාමාවලිය යළි විමර්ශනය කිරීමට, ලංකා කුරුලු සංගමය අනුකමිටුවක් පත් කළේ ය. එය, ඩග්ලස් රණසිංහ, සරත් සෙනෙවිරත්න, පී. බී. කරුණාරත්න, ජගත් ගුණවර්ධන, දීපාල් වරකාගොඩ සහ උපාලි ඒකනායක ගෙන් සමන්විත වූ අතර, එයට අවශ්‍ය වන, බස හැසිරවීම හා නාමකරණ ක්‍රමවේද පිළිබඳ විශේෂඥ උපදෙස් සිංහල පිළිබඳ මහාචාර්ය ජේ. බී. දිසානායක ලබා දුන්නේ ය.

මෙහිදී සිංහල කුරුලු නාමකරණය සඳහා පැහැදිලි ක්‍රමවේදයක් ලේඛනගත කරන ලදි. ජනවහරේ පැවති නම් වලට ප්‍රමුඛත්වයක් දෙනු ලැබී ය. නිදසුන් ලෙස, ගිනිකුරුල්ලා, පණුකුරුල්ලා, සිවුරුහොරා, සුදුරෙදිහොරා, යන නම් එහි එලෙසම භාවිත විය. විද්‍යාත්මක නාමකරණය පිළිබිඹු වන අයුරින්, ඩී. ජේ. ඒ. පෙරේරා සහ පක්ෂි විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය එස්. ඩබ්. කොටගම සම්පාදනය කළ, 1983 දී පළ වූ, ‘ශ්‍රී ලංකාවේ කුරුල්ලන් සඳහා ක්‍රමානුකූල නාමාවලිය’ ද මෙහිදී සැලකීමට ලක් විය.

1995 කමිටුව මෙසේ සැකසූ, සිංහල කුරුලු නාමාවලියෙහි මෙම දෙවන සංස්කරණය එළි දක්වනු ලැබුවේ, 2001 දී, ලංකා කුරුලු සංගමය පළ කළ, කිත්සිරි ගුණවර්ධන ගේ, ‘සියොත් විත්ති’ ග්‍රන්ථය තුළින් ය. මින් පෙර, ජී. එම්. හෙන්රි ගේ ඉහත කී කෘතියේ 1998 සංස්කරණයෙහි ද, මේ කුරුලු නම් ඉංග්‍රීසි අකුරින් ඇතුලත් විය.

මෙහි ඇතැම් කුරුලු වර්ග සඳහා ඉංග්‍රීසි නමෙහි සහ නිබැඳි සිංහල නමෙහි අරුත් වෙනසක් කැපී පෙනෙනු ඇත. මෙයට හේතුව, ඒ ඉංග්‍රීසි නම් වලින්, එවැනි වර්ගයක් ලොවෙහි පැතිරි මුළු පරාසය හරහා, එහි විවිධ උපවර්ග අනුව, හෝ සංක්‍රමණික ඍතු අනුව, වෙනස් වන පෙනුම පොදු ලෙස, හෝ, එහි විදෙස් පරිසරයක් ගැන, කියැවෙන මුත්, මෙරට තුළ, මේවා අදාල නොවන අතර, වෙනත් විස්තරයක් උචිත වන නිසා ය.

2020 දී, මෙරට තුළ 1995 නාමාවලියෙන් පසුව වාර්තා වූ කුරුලු වර්ගයන්ට නම් නිබැඳීමට ද, නැවත එහි නම් සමාලෝචනය කිරීමට ද, ලංකා කුරුලු සංගමය අනුකමිටුවක් පත් කළේ ය. එහි පුළුල් සාමාජිකත්වය තුළ ඇති ක්ෂේත්‍ර දැනුම උපයෝගී වන ලෙස, මෙහි ඩග්ලස් රණසිංහ, සරත් සෙනෙවිරත්න, පත්මනාත් සමරවීර, ජගත් ගුණවර්ධන, දීපාල් වරකාගොඩ, උපාලි ඒකනායක, හේමන්ත සෙනෙවිරත්න, කිත්සිරි ගුණවර්ධන, උදිත හෙට්ටිගේ, සුධීර බණ්ඩාර, සහ ගෙහාන් රජීව් වූහ.

කමිටුව එකඟතාවට නොපැමිණි න්‍යාය සහ නම් සඳහා විසඳුම් විවෘතව තබන ලෙසට යළිත් තීරණය විය. උදාහරණයක් නම්, “පොල්කිච්චා” වැනි, බොහෝ දෙනෙකු තනි පදයකින් හඳුනන වර්ගයකට සමීප වර්ගයන්ට ඒ නම පෙර පද සමග යොදා ඇති සේ, එම වර්ගයට ද එහි සුලබ බව හඟවන යම් පෙර පදයක් නමට යෙදිය යුතු ද, එය කුමක් ද, යන්න ය.

2022 වන විට මෙරට තුළ නිශ්චිත ලෙස වාර්තා වූ වර්ග 463 හි නම් ඇතුළත් වන, 2022 සිංහල නාමාවලියෙහි තෙවන සංස්කරණය මෙසේ ඉදිරිපත් කරමු. මෙහි වර්ග හා උපවර්ග සකසා ඇත්තේ, වර්තමානයේ දී ඩී. වරකාගොඩ සහ එච්. වරකාගොඩ විසින් සම්පාදනය වෙමින් පවතින, ලංකා කුරුලු සංගමය විසින් පළ කරනු ලබන, Checklist of the Birds of Sri Lanka කෘතිය සඳහා ද පදනම් කරගත්, අද ලොව වඩාත්ම පිළිගනු ලැබූ විද්‍යාතමක කුරුලු වර්ගීකරණය හා අනුපිළිවෙළ දැක්වෙන AviList: The Global Avian Checklist නාමාවලියට අනුව ය.

**සිංහල කුරුලු නාමාවලි අනුකමිටුව 2020-2022**
**ලංකා කුරුලු සංගමය**

© ලංකා කුරුලු සංගමය, 2026

## නාමාවලිය

E – ශ්‍රී ලංකාවට ආවේනික (Endemic to Sri Lanka)

### Order ANSERIFORMES

Family ANATIDAE **DUCKS, SWANS AND GEESE**

1. **Fulvous Whistling Duck** මහ තඹසේරුවා *Dendrocygna bicolor*
2. **Lesser Whistling Duck** තඹසේරුවා *Dendrocygna javanica*
3. **Cotton Pygmy Goose** මල්සේරුවා *Nettapus coromandelianus*

4. **Bar-headed Goose** දාරඉස් පාත්තයා *Anser indicus*
5. **Greylag Goose** අළු පාත්තයා *Anser anser*
6. **Ruddy Shelduck** පඬු පාත්තයා *Tadorna ferruginea*
7. **Knob-billed Duck** කැබලිතියා *Sarkidiornis melanotos*
8. **Tufted Duck** කොණ්ඩ සේරුවා *Aythya fuligula*
9. **Garganey** බැමසුදු සේරුවා *Spatula querquedula*
10. **Northern Shoveler** පත්තුඩු තාරාවා *Spatula clypeata*
11. **Gadwall** අළු තාරාවා *Mareca strepera*
12. **Eurasian Wigeon** රත්පට තාරාවා *Mareca penelope*
13. **Indian Spot-billed Duck** දෙතිත් තාරාවා *Anas poecilorhyncha*
14. **Northern Pintail** උල්පෙඳ තාරාවා *Anas acuta*
15. **Green-winged Teal** රට මල්සේරුවා *Anas crecca*

**Order GALLIFORMES**
Family PHASIANIDAE **PARTRIDGES, PHEASANTS, GROUSE AND ALLIES**

16. **Indian Peafowl** මොණරා *Pavo cristatus*
17. **Sri Lanka Spurfowl** හබන්කුකුළා *Galloperdix bicalcarata* E
18. **Sri Lanka Junglefowl** වලිකුකුළා *Gallus lafayettii* E
19. **Grey Francolin** උස්වටුවා *Ortygornis pondicerianus*
20. **Painted Francolin** පතන්කුකුළා *Francolinus pictus*
21. **King Quail** නිල් වටුවා *Synoicus chinensis*
22. **Rain Quail** වැහි වටුවා *Coturnix coromandelica*
23. **Jungle Bush-quail** පඳුරු වටුවා *Perdicula asiatica*

**Order PHOENICOPTERIFORMES**
Family PHOENICOPTERIDAE **FLAMINGOS**

24. **Lesser Flamingo** රෝස සීයක්කාරයා *Phoeniconaias minor*
25. **Greater Flamingo** සීයක්කාරයා *Phoenicopterus roseus*

**Order PODICIPEDIFORMES**
Family PODICIPEDIDAE **GREBES**

26. **Little Grebe** ගෙඹිසේරා *Tachybaptus ruficollis*

**Order CUCULIFORMES**
Family CUCULIDAE **CUCKOOS**

27. **Green-billed Coucal** බට ඇටිකුකුළා *Centropus chlororhynchos* E
28. **Greater Coucal** ඇටිකුකුළා *Centropus sinensis*
29. **Sirkeer Malkoha** පතන් ඇටිකුකුළා *Taccocua leschenaultii*
30. **Red-faced Malkoha** වතරතු මල්කොහා *Phaenicophaeus pyrrhocephalus* E
31. **Blue-faced Malkoha** වතනිල් මල්කොහා *Phaenicophaeus viridirostris*
32. **Chestnut-winged Cuckoo** රතු කොණ්ඩකොහා *Clamator coromandus*
33. **Jacobin Cuckoo** කොණ්ඩකොහා *Clamator jacobinus*
34. **Asian Koel** කොහා / කොවුලා *Eudynamys scolopaceus*
35. **Asian Emerald Cuckoo** පළා කොහා *Chrysococcyx maculatus*
36. **Banded Bay Cuckoo** වයිරම් කොහා *Cacomantis sonneratii*
37. **Grey-bellied Cuckoo** හීන් කොහා *Cacomantis passerinus*
38. **Fork-tailed Drongo-Cuckoo** කවුඩු කොහා *Surniculus dicruroides*
39. **Common Hawk-Cuckoo** උකුසු කොහා *Hierococcyx varius*
40. **Lesser Cuckoo** පුංචි කොහා *Cuculus poliocephalus*
41. **Indian Cuckoo** කෝණ කොහා *Cuculus micropterus micropterus*
42. **Common Cuckoo** රට කොහා *Cuculus canorus*

**Order COLUMBIFORMES**

Family COLUMBIDAE **DOVES AND PIGEONS**

43. **Spotted Dove** අළු කොබෙයියා *Spilopelia chinensis*
44. **Red Turtle Dove** රතු කොබෙයියා *Streptopelia tranquebarica*
45. **Oriental Turtle Dove** තඹල කොබෙයියා *Streptopelia orientalis*
46. **Eurasian Collared Dove** මාල කොබෙයියා *Streptopelia decaocto*
47. **Sri Lanka Woodpigeon** මයිලගොයා *Columba torringtoniae* E
48. **Pale-capped Pigeon** දම් මයිලගොයා *Columba punicea*
49. **Rock Dove** ගල් පරෙවියා *Columba livia intermedia*
50. **Common Emerald Dove** නීල කොබෙයියා *Chalcophaps indica*
51. **Orange-breasted Green Pigeon** ලැමරන් බටගොයා *Treron bicinctus*
52. **Sri Lanka Green Pigeon** පිටරතු බටගොයා *Treron pompadora* E
53. **Yellow-footed Green Pigeon** පාදකහ බටගොයා *Treron phoenicopterus*
54. **Green Imperial Pigeon** මහ නීලගොයා *Ducula aenea*

**Order GRUIFORMES**

Family RALLIDAE **RAILS, GALLINULES AND COOTS**

55. **Brown-cheeked Rail** දිය කොරවක්කා *Rallus indicus*
56. **Corncrake** ගොඩ කොරවක්කා *Crex crex*
57. **Slaty-breasted Rail** නිල් මැටිකොරවක්කා *Lewinia striata*
58. **Common Moorhen** විල්කුකුලා *Gallinula chloropus*
59. **Eurasian Coot** දැලි කිතලා *Fulica atra*
60. **Purple Swamphen** කිතලා *Porphyrio porphyrio*
61. **Watercock** මහ විල්කුකුලා *Gallicrex cinerea*
62. **White-breasted Waterhen** කොරවක්කා *Amaurornis phoenicurus*
63. **Slaty-legged Crake** දාර කොරවක්කා *Rallina eurizonoides*
64. **Ruddy-breasted Crake** රතු මැටිකොරවක්කා *Zapornia fusca*
65. **Baillon's Crake** පුංචි මැටිකොරවක්කා *Zapornia pusilla*

**Order CHARADRIIFORMES**

Family BURHINIDAE **THICK-KNEES AND STONE-CURLEWS**

66. **Great Stone-curlew** මහ ගොළුකිරලා *Esacus recurvirostris*
67. **Indian Stone-curlew** ගොළුකිරලා *Burhinus indicus*

Family RECURVIROSTRIDAE **AVOCETS AND STILTS**

68. **Pied Avocet** අවසැත්තා *Recurvirostra avosetta*
69. **Black-winged Stilt** කලපු කිරලා *Himantopus himantopus*

Family HAEMATOPODIDAE **OYSTERCATCHERS**

70. **Eurasian Oystercatcher** මට්ටිකාවා *Haematopus ostralegus*

Family CHARADRIIDAE **PLOVERS AND LAPWINGS**

71. **Grey Plover** අළු ඔලෙයියා *Pluvialis squatarola*
72. **Pacific Golden Plover** රන්ඔලෙයියා / රණවටුවා *Pluvialis fulva*
73. **Common Ringed Plover** මහ මාලඔලෙයියා *Charadrius hiaticula*
74. **Little Ringed Plover** මාලඔලෙයියා *Thinornis dubius*
75. **Yellow-wattled Lapwing** කහතැලි කිරලා *Vanellus malabaricus*
76. **Grey-headed Lapwing** හිසඅළු කිරලා *Vanellus cinereus*
77. **Red-wattled Lapwing** කිරලා *Vanellus indicus*
78. **Sociable Lapwing** රංචු කිරලා *Vanellus gregarius*
79. **Caspian Plover** කැස්පියානු ඔලෙයියා *Anarhynchus asiaticus*
80. **Oriental Plover** පෙරදිග ඔලෙයියා *Anarhynchus veredus*

81. **Tibetan Sand Plover** කුඩා වැලිඔලෙයියා *Anarhynchus atrifrons*
82. **Greater Sand Plover** මහ වැලිඔලෙයියා *Anarhynchus leschenaultia*
83. **Kentish Plover** බෝල ඔලෙයියා *Anarhynchus alexandrinus*

Family ROSTRATULIDAE **PAINTED-SNIPES**

84. **Greater Painted-snipe** මල්කැස්වටුවා *Rostratula benghalensis*

Family JACANIDAE **JACANAS**

85. **Pheasant-tailed Jacana** බළල්සේරා *Hydrophasianus chirurgus*

Family SCOLOPACIDAE **SANDPIPERS AND ALLIES**

86. **Eurasian Whimbrel** දෑතුඩුවටුවා *Numenius phaeopus*
87. **Eurasian Curlew** මහ දෑතුඩුවටුවා *Numenius arquata*
88. **Bar-tailed Godwit** දාර මහවටුවා *Limosa lapponica*
89. **Black-tailed Godwit** පෙඳකලු මහවටුවා *Limosa limosa*
90. **Asian Dowitcher** ආසියානු මහවටුවා *Limnodromus semipalmatus*
91. **Jack Snipe** පුංචි කැස්වටුවා *Lymnocryptes minimus*
92. **Eurasian Woodcock** වන කැස්වටුවා *Scolopax rusticola*
93. **Wood Snipe** කඳු කැස්වටුවා *Gallinago nemoricola*
94. **Great Snipe** මහ කැස්වටුවා *Gallinago media*
95. **Swinhoe's Snipe** චීන කැස්වටුවා *Gallinago megala*
96. **Pin-tailed Snipe** උල්පෙඳ කැස්වටුවා *Gallinago stenura*
97. **Common Snipe** අවන්පෙඳ කැස්වටුවා *Gallinago gallinago*
98. **Terek Sandpiper** අවසැත සිලිවටුවා *Xenus cinereus*
99. **Common Sandpiper** මිටි සිලිවටුවා *Actitis hypoleucos*
100. **Red-necked Phalarope** ගෙලරතු දියවටුවා *Phalaropus lobatus*
101. **Green Sandpiper** කොළ සිලිවටුවා *Tringa ochropus*
102. **Marsh Sandpiper** වගුරු සිලිවටුවා *Tringa stagnatilis*
103. **Wood Sandpiper** වන සිලිවටුවා *Tringa glareola*
104. **Common Redshank** පාරතුසිලිවටුවා *Tringa totanus*
105. **Spotted Redshank** පුල්ලි පාරතුසිලිවටුවා *Tringa erythropus*
106. **Common Greenshank** පාකොළසිලිවටුවා *Tringa nebularia*
107. **Ruddy Turnstone** කැටපෙරළන්නා *Arenaria interpres*
108. **Red Knot** රතු මහසිලිවටුවා *Calidris canutus*
109. **Great Knot** මහසිලිවටුවා *Calidris tenuirostris*
110. **Ruff** ලොවිච්චි සිලිවටුවා *Calidris pugnax*
111. **Sharp-tailed Sandpiper** උල්පෙඳ සිලිවටුවා *Calidris acuminata*
112. **Broad-billed Sandpiper** තුඩපළල් සිලිවටුවා *Calidris falcinellus*
113. **Curlew Sandpiper** දෑකැති සිලිවටුවා *Calidris ferruginea*
114. **Spoon-billed Sandpiper** හැඳි සිලිවටුවා *Calidris pygmaea*
115. **Red-necked Stint** ගෙලරතු පුංචි සිලිවටුවා *Calidris ruficollis*
116. **Temminck's Stint** සිඟිති සිලිවටුවා *Calidris temminckii*
117. **Long-toed Stint** දිගැඟිලි සිලිවටුවා *Calidris subminuta*
118. **Buff-breasted Sandpiper** පඬු සිලිවටුවා *Calidris subruficollis*
119. **Sanderling** වැලි සිලිවටුවා *Calidris alba*
120. **Dunlin** බඩකලු සිලිවටුවා *Calidris alpina*
121. **Pectoral Sandpiper** අවුල්හැර සිලිවටුවා *Calidris melanotos*
122. **Little Stint** පුංචි සිලිවටුවා *Calidris minuta*

Family TURNICIDAE **BUTTONQUAILS**

123. **Barred Buttonquail** බෝලවටුවා *Turnix suscitator*
124. **Common Buttonquail** පුංචි බෝලවටුවා *Turnix sylvaticus*

Family DROMADIDAE **CRAB-PLOVER**

125. **Crab-plover** කකුළුඔලෙයියා *Dromas ardeola*

Family GLAREOLIDAE **COURSERS AND PRATINCOLES**

126. **Indian Courser** වැලිකිරලා *Cursorius coromandelicus*
127. **Small Pratincole** පුංචි ලිහිණිඔලෙයියා *Glareola lactea*
128. **Oriental Pratincole** මහ ලිහිණිඔලෙයියා *Glareola maldivarum*
129. **Collared Pratincole** දිගුපෙඳ ලිහිණිඔලෙයියා *Glareola pratincola*

Family STERCORARIIDAE **JAEGERS AND SKUAS**

130. **Parasitic Jaeger** උල්පෙඳ මුහුදුහොරා *Stercorarius parasiticus*
131. **Long-tailed Jaeger** දිගුපෙඳ මුහුදුහොරා *Stercorarius longicaudus*
132. **Pomarine Jaeger** හැඳිපෙඳ මුහුදුහොර *Stercorarius pomarinus*
133. **South Polar Skua** කෙටිපෙඳ මුහුදුහොරා *Catharacta maccormicki*
134. **Brown Skua** දුඹුරු මුහුදුහොරා *Catharacta antarcticus*

Family LARIDAE **SKIMMERS, NODDIES TERNS AND GULLS**

135. **Brown Noddy** මහ දුඹුරුමුහුදුලිහිණියා *Anous stolidus*
136. **Lesser Noddy** කුඩා දුඹුරුමුහුදුලිහිණියා *Anous tenuirostris*
137. **Sooty Tern** දැලි මුහුදුලිහිණියා *Onychoprion fuscatus*
138. **Bridled Tern** බැමසුදු මුහුදුලිහිණියා *Onychoprion anaethetus*
139. **Little Tern** පුංචි මුහුදුලිහිණියා *Sternula albifrons*
140. **Saunders's Tern** දුඹුරුපා මුහුදුලිහිණියා *Sternula saundersi*
141. **Caspian Tern** රත්තුඩු මුහුදුලිහිණියා *Hydroprogne caspia*
142. **Gull-billed Tern** හිසකලු මුහුදුලිහිණියා *Gelochelidon nilotica*
143. **Whiskered Tern** රැවුල් මුහුදුලිහිණියා *Chlidonias hybrida*
144. **White-winged Tern** තටුසුදු මුහුදුලිහිණිය *Chlidonias leucopterus*
145. **Black Tern** කලු මුහුදුලිහිණියා *Chlidonias niger*
146. **Sandwich Tern** කලුතුඩු කොණ්ඩමුහුදුලිහිණියා *Thalasseus sandvicensis*
147. **Greater Crested Tern** මහ කොණ්ඩමුහුදුලිහිණියා *Thalasseus bergii*
148. **Lesser Crested Tern** කුඩා කොණ්ඩමුහුදුලිහිණියා *Thalasseus bengalensis*
149. **Common Tern** අළු මුහුදුලිහිණියා *Sterna hirundo*
150. **Black-naped Tern** ඇස්පටි මුහුදුලිහිණියා *Sterna sumatrana*
151. **Roseate Tern** රෝස මුහුදුලිහිණියා *Sterna dougallii*
152. **Slender-billed Gull** හීන්තුඩු මුහුදුකපුටා *Chroicocephalus genei*
153. **Black-headed Gull** හිසකලු මුහුදුකපුටා *Chroicocephalus ridibundus*
154. **Brown-headed Gull** හිසදුඹුරු මුහුදුකපුටා *Chroicocephalus brunnicephalus*
155. **Pallas's Gull** හිසකලු මහමුහුදුකපුටා *Ichthyaetus ichthyaetus*
156. **Sooty Gull** දැලි මුහුදුකපුටා *Ichthyaetus hemprichii*
157. **Lesser Black-backed Gull** පිටකලු මුහුදුකපුටා *Larus fuscus*

**Order PHAETHONTIFORMES**

Family PHAETHONTIDAE **TROPICBIRDS**

158. **Red-billed Tropicbird** රත්තුඩු ගිම්වලයා *Phaethon aethereus*
159. **White-tailed Tropicbird** කහතුඩු ගිම්වලයා *Phaethon lepturus*

**Order PROCELLARIIFORMES**

Family OCEANITIDAE **SOUTHERN STORM PETRELS**

160. **Wilson's Storm Petrel** සුදුකටී කුණාටුපිටරැළියා *Oceanites oceanicus*
161. **White-faced Storm Petrel** වතසුදු කුණාටුපිටරැළියා *Pelagodroma marina*
162. **Black-bellied Storm Petrel** උදරකලු කුණාටුපිටරැළියා *Fregetta tropica*

Family HYDROBATIDAE **NORTHERN STORM PETRELS**

163. **Swinhoe's Storm Petrel** දුඹුරු කුණාටුපිටරැළියා *Hydrobates monorhis*

Family PROCELLARIIDAE **PETRELS, SHEARWATERS AND DIVING PETRELS**

164. **Pintado Petrel** ගෝමර පිටරැළියා *Daption capense*
165. **Bulwer's Petrel** පුංචි පිටරැළියා *Bulweria bulwerii*
166. **Jouanin's Petrel** දුඹුරු පිටරැළියා *Bulweria fallax*
167. **Streaked Shearwater** වතසුදු රළකපන්නා *Calonectris leucomelas*
168. **Wedge-tailed Shearwater** දිගුපෙඳ රළකපන්නා *Ardenna pacifica*
169. **Short-tailed Shearwater** කෙටිපෙඳ රළකපන්නා *Ardenna tenuirostris*
170. **Sooty Shearwater** දැලි රළකපන්නා *Ardenna grisea*
171. **Flesh-footed Shearwater** රෝසපා රළකපන්නා *Ardenna carneipes*
172. **Barau's Petrel** අළු පිටරැළියා *Pterodroma baraui*

**Order CICONIIFORMES**

Family CICONIIDAE **STORKS**

173. **Asian Openbill** බෙල්ලන් කොකා *Anastomus oscitans*
174. **Lesser Adjutant** තට්ට මානකොකා *Leptoptilos javanicus*
175. **Painted Stork** ඇඹල මානකොකා *Mycteria leucocephala*
176. **Black-necked Stork** අලි මානකොකා *Ephippiorhynchus asiaticus*
177. **Black Stork** කළු මානකොකා *Ciconia nigra*
178. **White Stork** සුදු මානකොකා *Ciconia ciconia*
179. **Asian Woolly-necked Stork** පාදිලි මානකොකා *Ciconia episcopus*

**Order SULIFORMES**

Family FREGATIDAE **FRIGATEBIRDS**

180. **Lesser Frigatebird** පුංචි මුහුදුසැහැසියා *Fregata ariel*
181. **Christmas Frigatebird** නත්තල්දූ මුහුදුසැහැසියා *Fregata andrewsi*
182. **Great Frigatebird** මහ මුහුදුසැහැසියා *Fregata minor*

Family SULIDAE **BOOBIES AND GANNETS**

183. **Red-footed Booby** රත්පා කෙලවලුබස්සා *Sula sula*
184. **Brown Booby** දුඹුරු කෙලවලුබස්සා *Sula leucogaster*
185. **Masked Booby** වතකලු කෙලවලුබස්සා *Sula dactylatra*

Family ANHINGIDAE **ANHINGA AND DARTERS**

186. **Oriental Darter** හංසකාවා *Anhinga melanogaster*

Family PHALACROCORACIDAE **CORMORANTS AND SHAGS**

187. **Little Cormorant** පුංචි දියකාවා *Microcarbo niger*
188. **Great Cormorant** මහ දියකාවා *Phalacrocorax carbo*
189. **Indian Cormorant** දාර දියකාවා *Phalacrocorax fuscicollis*

**Order PELECANIFORMES**

Family THRESKIORNITHIDAE **IBISES AND SPOONBILLS**

190. **Glossy Ibis** සිලුටු දැතුඩුවා *Plegadis falcinellus*
191. **Eurasian Spoonbill** හැඳිආලාවා *Platalea leucorodia*
192. **Black-headed Ibis** සුදු දැතුඩුවා *Threskiornis melanocephalus*

Family PELECANIDAE **PELICANS**

193. **Spot-billed Pelican** අළු පැස්තුඩුවා *Pelecanus philippensis*

Family ARDEIDAE **HERONS, EGRETS AND BITTERNS**

194. **Eurasian Bittern** දාර මැටිකොකා *Botaurus stellaris*
195. **Black Bittern** කලු මැටිකොකා *Botaurus flavicollis*
196. **Cinnamon Bittern** තඹල මැටිකොකා *Botaurus cinnamomeus*
197. **Von Schrenck's Bittern** ගුරු මැටිකොකා *Botaurus eurhyphmus*
198. **Yellow Bittern** කහ මැටිකොකා *Botaurus sinensis*
199. **Malayan Night Heron** වයිරම් මැටිකොකා *Gorsachius melanolophus*
200. **Western Reef-Heron** කරදිය කොකා *Egretta gularis*
201. **Little Egret** පුංචි සුදුකොකා *Egretta garzetta*
202. **Black-crowned Night Heron** රෑකොකා *Nycticorax nycticorax*
203. **Little Heron** කඩොල් කොකා *Butorides atricapilla*
204. **Indian Pond Heron** කණකොකා *Ardeola grayii*
205. **Chinese Pond Heron** රතු කණකොකා *Ardeola bacchus*
206. **Great Egret** මහ සුදුකොකා *Ardea alba*
207. **Medium Egret** මැදි සුදුකොකා *Ardea intermedia*
208. **Eastern Cattle Egret** එඬේර කොකා *Ardea coromanda*
209. **Purple Heron** කරවැල් කොකා *Ardea purpurea*
210. **Goliath Heron** යෝධ කොකා *Ardea goliath*
211. **Grey Heron** කලපු කොකා *Ardea cinerea*

**Order CAPRIMULGIFORMES**

Family CAPRIMULGIDAE **NIGHTJARS AND NIGHTHAWKS**

212. **Great Eared Nightjar** මහ බිම්බස්සා *Lyncornis macrotis*
213. **Jungle Nightjar** කඳුකර බිම්බස්සා *Caprimulgus indicus*
214. **Jerdon's Nightjar** පෙඳදිග බිම්බස්සා *Caprimulgus atripennis*
215. **Indian Nightjar** පුංචි බිම්බස්සා *Caprimulgus asiaticus*

**Order PODARGIFORMES**

Family PODARGIDAE **FROGMOUTHS**

216. **Sri Lanka Frogmouth** ගෙඹිකටබස්සා *Batrachostomus moniliger*

**Order APODIFORMES**

Family HEMIPROCNIDAE **TREESWIFTS**

217. **Crested Treeswift** රුක්වේගලිහිණියා *Hemiprocne coronata*

Family APODIDAE **SWIFTS**

218. **Brown-backed Needletail** කටුපෙඳ වේගලිහිණියා *Hirundapus giganteus*
219. **Asian Palm Swift** තල් වේගලිහිණියා *Cypsiurus balasiensis*
220. **Alpine Swift** මහ වේගලිහිණියා *Tachymarptis melba*
221. **Fork-tailed Swift** දාර වේගලිහිණියා *Apus pacificus*
222. **Little Swift** සුදුකටී වේගලිහිණියා *Apus affinis*
223. **Indian Swiftlet** කැදලි වේගලිහිණියා *Aerodramus unicolor*

**Order STRIGIFORMES**

Family TYTONIDAE **BAY OWLS AND BARN OWLS**

224. **Sri Lanka Bay Owl** තඹල බස්සා *Phodilus assimilis*
225. **Eastern Barn Owl** අටු බකමූණා *Tyto javanica*

Family STRIGIDAE **OWLS**

226. **Brown Boobook** උකුසු බස්සා *Ninox scutulata*
227. **Jungle Owlet** වයිරම් බස්සා *Glaucidium radiatum*
228. **Chestnut-backed Owlet** මූකලන් බස්සා *Glaucidium castanotum* E

229. **Serendib Scops Owl** පඬුවන් බස්සා *Otus thilohoffmanni* E
230. **Indian Scops Owl** බස්සා *Otus bakkamoena*
231. **Oriental Scops Owl** පුංචි බස්සා *Otus sunia*
232. **Short-eared Owl** බිම් බකමූණා *Asio flammeus*
233. **Brown Fish Owl** මාළු බකමූණා *Ketupa zeylonensis*
234. **Spot-bellied Eagle-Owl** මහ බකමූණා / උලමා *Ketupa nipalensis*
235. **Brown Wood Owl** වන බකමූණා *Strix leptogrammica*

**Order ACCIPITRIFORMES**

Family PANDIONIDAE **OSPREY**

236. **Osprey** මාළු උකුස්සා *Pandion haliaetus*

Family ACCIPITRIDAE **KITES, OLD WORLD VULTURES, EAGLES AND HAWKS**

237. **Black-winged Kite** පතන් උකුස්සා *Elanus caeruleus*
238. **Egyptian Vulture** සුදු ගිජුලිහිණියා *Neophron percnopterus*
239. **Jerdon’s Baza** දුඹුරු කොණ්ඩඋකුස්සා *Aviceda jerdoni*
240. **Black Baza** කලු කොණ්ඩඋකුස්සා *Aviceda leuphotes*
241. **European Honey Buzzard** යුරෝපීය බඹරඋකුස්සා *Pernis apivorus*
242. **Crested Honey Buzzard** කොණ්ඩ බඹරඋකුස්සා *Pernis ptilorhynchus*
243. **Crested Serpent Eagle** සර්ප රාජාලියා *Spilornis cheela*
244. **Legge’s Hawk-Eagle** මහ කොණ්ඩරාජාලියා *Nisaetus kelaarti*
245. **Changeable Hawk-eagle** කොණ්ඩරාජාලියා *Nisaetus cirrhatus*
246. **Rufous-bellied Eagle** බඩරතු රාජාලියා *Lophotriorchis kienerii*
247. **Black Eagle** කලු රාජාලියා *Ictinaetus malaiensis*
248. **Greater Spotted Eagle** මහ ගෝමරරාජාලියා *Clanga clanga*
249. **Booted Eagle** අළුපෙඳ රාජාලියා *Hieraaetus pennatus*
250. **Bonelli's Eagle** දුඹුරු මහරාජාලියා *Aquila fasciata*
251. **Crested Goshawk** කොණ්ඩ කුරුලුගොයා *lophospiza trivirgata*
252. **Besra** පුංචි කුරුලුගොයා *Tachyspiza virgata*
253. **Shikra** කුරුලුගොයා *Tachyspiza badia*
254. **Eurasian Sparrowhawk** රට කුරුලුගොයා *Accipiter nisus*
255. **Pallid Harrier** සුදු බිංඋකුස්සා *Circus macrourus*
256. **Montagu's Harrier** අළු බිංඋකුස්සා *Circus pygargus*
257. **Pied Harrier** ගෝමර බිංඋකුස්සා *Circus melanoleucos*
258. **Western Marsh Harrier** වගුරු බිංඋකුස්සා *Circus aeruginosus*
259. **Brahminy Kite** බ්‍රාහ්මණ උකුස්සා *Haliastur indus*
260. **Black Kite** කලු උකුස්සා *Milvus migrans*
261. **White-bellied Sea Eagle** මුහුදු රාජාලියා *Ichthyophaga leucogaster*
262. **Grey-headed Fish Eagle** වැව් රාජාලියා *Ichthyophaga ichthyaetus*
263. **Common Buzzard** දුඹුරු දෙණිකුස්සා *Buteo buteo*
264. **Long-legged Buzzard** පඬුපෙඳ දෙණිකුස්සා *Buteo rufinus*

**Order TROGONIFORMES**

Family TROGONIDAE **TROGONS**

265. **Malabar Trogon** මහගිනිකුරුල්ලා *Harpactes fasciatus*

**Order BUCEROTIFORMES**

Family UPUPIDAE **HOOPOES**

266. **Common Hoopoe** පොරෝකුරුල්ලා *Upupa epops*

Family BUCEROTIDAE **HORNBILLS**

267. **Sri Lanka Grey Hornbill** අළු කෑදැත්තා *Ocyceros gingalensis* E

268. **Malabar Pied Hornbill** පොරෝ කෑඳැත්තා *Anthracoceros coronatus*

**Order CORACIIFORMES**
Family CORACIIDAE **ROLLERS**

269. **Oriental Dollarbird** කැටකෑලා *Eurystomus orientalis*
270. **Indian Roller** දුම්බොන්නා *Coracias benghalensis*
271. **European Roller** ලානිල් දුම්බොන්නා *Coracias garrulus*

Family MEROPIDAE **BEE-EATERS**

272. **Chestnut-headed Bee-eater** කෙටිපෙඳ කුරුමිණිකුරුල්ලා *Merops leschenaulti*
273. **Asian Green Bee-eater** හීන් කුරුමිණිකුරුල්ලා *Merops orientalis*
274. **European Bee-eater** රට කුරුමිණිකුරුල්ලා *Merops apiaster*
275. **Blue-tailed Bee-eater** මහ කුරුමිණිකුරුල්ලා *Merops philippinus*

Family ALCEDINIDAE **KINGFISHERS**

276. **Blue-eared Kingfisher** නිල්කන් මල්පිළිහුඩුවා *Alcedo meninting*
277. **Common Kingfisher** මල්පිළිහුඩුවා *Alcedo atthis*
278. **Black-backed Dwarf Kingfisher** රන් පිළිහුඩුවා *Ceyx erithaca*
279. **Pied Kingfisher** ගෝමර පිළිහුඩුවා *Ceryle rudis*
280. **Stork-billed Kingfisher** මහ පිළිහුඩුවා *Pelargopsis capensis*
281. **Black-capped Kingfisher** දම් පිළිහුඩුවා *Halcyon pileata*
282. **White-throated Kingfisher** පිළිහුඩුවා *Halcyon smyrnensis*

**Order PICIFORMES**
Family MEGALAIMIDAE **ASIAN BARBETS**

283. **Crimson-fronted Barbet** හීන් කොට්ටෝරුවා *Psilopogon rubricapillus* E
284. **Coppersmith Barbet** මල් කොට්ටෝරුවා *Psilopogon haemacephalus*
285. **Brown-headed Barbet** පොළොස් කොට්ටෝරුවා / ජම්බු කොට්ටෝරුවා *Psilopogon zeylanicus*
286. **Yellow-fronted Barbet** මූකලන් කොට්ටෝරුවා *Psilopogon flavifrons* E

Family PICIDAE **WOODPECKERS**

287. **Eurasian Wryneck** දුඹුරු බිම්කෑරලා *Jynx torquilla*
288. **Rufous Woodpecker** දුඹුරු කෑරලා *Micropternus brachyurus*
289. **Black-rumped Flameback** රන් කෑරලා *Dinopium benghalense*
290. **Red-backed Flameback** රතු කෑරලා *Dinopium psarodes* E
291. **Lesser Yellownape** කොළ කෑරලා *Picus chlorolophus*
292. **Streak-throated Woodpecker** ළාකොළ කෑරලා *Picus xanthopygaeus*
293. **Crimson-backed Flameback** මහ රතුකෑරලා *Chrysocolaptes stricklandi* E
294. **White-naped Woodpecker** මහ රන්කෑරලා *Chrysocolaptes festivus*
295. **Brown-capped Pygmy Woodpecker** හීන් කෑරලා *Yungipicu nanus*
296. **Yellow-crowned Woodpecker** ගෝමර කෑරලා *Leiopicus mahrattensis*

**Order FALCONIFORMES**
Family FALCONIDAE **FALCONS AND CARACARAS**

297. **Lesser Kestrel** නිල් කොබෙයිඋකුස්සා *Falco naumanni*
298. **Common Kestrel** කොබෙයිඋකුස්සා *Falco tinnunculus*
299. **Amur Falcon** පාරතු කොබෙයිඋකුස්සා *Falco amurensis*
300. **Oriental Hobby** පුංචි කොබෙයිඋකුස්සා *Falco severus*
301. **Eurasian Hobby** යුරෝපීය කොබෙයිඋකුස්සා *Falco subbuteo*
302. **Red-necked Falcon** හිසරතු කොබෙයිඋකුස්සා *Falco chicquera*

303. **Peregrine Falcon** මහ කොබෙයිඋකුස්සා *Falco peregrinus*
**Shaheen Falcon** බඩරතු කොබෙයිඋකුස්සා *F. c. peregrinator*

**Order PSITTACIFORMES**
Family PSITTACULIDAE **OLD WORLD PARROTS**
304. **Alexandrine Parakeet** ලබු ගිරවා *Psittacula eupatria*
305. **Rose-ringed Parakeet** මාල ගිරවා / රෑන ගිරවා *Psittacula krameri*
306. **Plum-headed Parakeet** පඬු ගිරවා *Psittacula cyanocephala*
307. **Layard's Parakeet** අළු ගිරවා *Psittacula calthrapae* E
308. **Sri Lanka Hanging Parrot** ගිරාමලිත්තා *Loriculus beryllinus* E

**Order PASSERIFORMES**
Family PITTIDAE **PITTAS**
309. **Indian Pitta** අවිච්චියා *Pitta brachyura*

Family CAMPEPHAGIDAE **CUCKOOSHRIKES**
310. **Small Minivet** හීන් ගිනිකුරුල්ලා *Pericrocotus cinnamomeus*
311. **Scarlet Minivet** ගිනිකුරුල්ලා *Pericrocotus flammeus*
312. **Indian Cuckooshrike** මහ කොවුලැස්පටියා *Coracina macei*
313. **Black-headed Cuckooshrike** හිසකලු කොවුලැස්පටියා *Lalage melanoptera*

Family ARTAMIDAE **WOODSWALLOWS, BELLMAGPIES AND ALLIES**
314. **Ashy Woodswallow** තල්ගස්කුරුල්ලා *Artamus fuscus*

Family AEGITHINIDAE **IORAS**
315. **Common Iora** කහපණුකුරුල්ලා *Aegithina tiphia*
316. **Marshall's Iora** හීන් කහපණුකුරුල්ලා *Aegithina nigrolutea*

Family VANGIDAE **VANGAS, HELMETSHRIKES AND ALLIES**
317. **Bar-winged Flycatcher-shrike** පුංචි කොවුලැස්පටියා *Hemipus picatus*
318. **Sri Lanka Woodshrike** වන කොවුලැස්පටියා *Tephrodornis affinis* E

Family ORIOLIDAE **OLD WORLD ORIOLES**
319. **Black-hooded Oriole** කහකුරුල්ලා *Oriolus xanthornus*
320. **Indian Golden Oriole** රන්කහකුරුල්ලා *Oriolus kundoo*
321. **Eurasian Golden Oriole** යුරෝපීය රන්කහකුරුල්ලා *Oriolus oriolus*
322. **Black-naped Oriole** කලුපිටිකර කහකුරුල්ලා *Oriolus chinensis*

Family RHIPIDURIDAE **FANTAILS AND SILKTAILS**
323. **White-browed Fantail** අවන්පෙඳ මැසිමාරා *Rhipidura aureola*

Family DICRURIDAE **DRONGOS**
324. **Sri Lanka Drongo** කොණ්ඩ කවුඩා *Dicrurus lophorinus* E
325. **Greater Racket-tailed Drongo** මහ කවුඩා *Dicrurus paradiseus*
326. **White-bellied Drongo** කවුඩා *Dicrurus caerulescens*
327. **Ashy Drongo** අළු කවුඩා *Dicrurus leucophaeus*
328. **Black Drongo** කලු කවුඩා *Dicrurus macrocercus*

Family MONARCHIDAE **MONARCH FLYCATCHERS, PARADISE FLYCATCHERS AND SHRIKEBILLS**

329. **Black-naped Monarch** නිල් මැසිමාරා *Hypothymis azurea*
330. **Indian Paradise Flycatcher** සිවුරුහොරා / සුදුරෙදිහොරා *Terpsiphone paradisi*

Family LANIIDAE **SHRIKES**

331. **Great Grey Shrike** මහ ඇස්පටියා *Lanius excubitor*
332. **Bay-backed Shrike** තඹවන් ඇස්පටියා *Lanius vittatus*
333. **Long-tailed Shrike** ගුරු ඇස්පටියා *Lanius schach*
334. **Brown Shrike** දුඹුරු ඇස්පටියා *Lanius cristatus*
    **Philippine Shrike** අළු ඇස්පටියා *L. c. lucionensis*

Family CORVIIDAE **CROWS, JAYS AND MAGPIES**

335. **Sri Lanka Blue Magpie** කැහිබෙල්ලා *Urocissa ornata* E
336. **House Crow** කොළඹ කපුටා *Corvus splendens*
337. **Large-billed Crow** කලු කපුටා *Corvus macrorhynchos*

Family STENOSTIRIDAE **FAIRY FLYCATCHERS**

338. **Grey-headed Canary-flycatcher** හිසඅළු මැසිමාරා *Culicicapa ceylonensis*

Family PARIDAE **TITS, CHICKADEES AND TITMICE**

339. **Cinereous Tit** අළු පණුකුරුල්ලා *Parus cinereus*

Family ALAUDIDAE **LARKS**

340. **Ashy-crowned Sparrow-Lark** රැන් ගීගොමරිට්ටා *Eremopterix griseus*
341. **Jerdon's Bush Lark** පඳුරු ගීගොමරිට්ටා *Plocealauda affinis*
342. **Oriental Skylark** කොණ්ඩ ගීගොමරිට්ටා *Alauda gulgula*
343. **Mongolian Short-toed Lark** ලාවන් ගීගොමරිට්ටා *Calandrella dukhunensis*

Family CISTICOLIDAE **CISTICOLAS AND ALLIES**

344. **Common Tailorbird** බට්ටිච්චා *Orthotomus sutorius*
345. **Grey-breasted Prinia** ළයඅළු හම්බුකුරුල්ලා *Prinia hodgsonii*
346. **Jungle Prinia** කලුවන් හම්බුකුරුල්ලා *Prinia sylvatica*
347. **Ashy Prinia** නිල් හම්බුකුරුල්ලා *Prinia socialis*
348. **Plain Prinia** බැමසුදු හම්බුකුරුල්ලා *Prinia inornata*
349. **Zitting Cisticola** දාර හම්බුකුරුල්ලා *Cisticola juncidis*

Family ACROCEPHALIDAE **REED WARBLERS AND ALLIES**

350. **Booted Warbler** ළාඳුඹුරු හම්බුකුරුල්ලා *Iduna caligata*
351. **Sykes's Warbler** කහඳුඹුරු හම්බුකුරුල්ලා *Iduna rama*
352. **Black-browed Reed Warbler** බැමකලු හම්බුකුරුල්ලා *Acrocephalus bistrigiceps*
353. **Blyth's Reed Warbler** පඳුරු හම්බුකුරුල්ලා *Acrocephalus dumetorum*
354. **Clamorous Reed Warbler** මහ හම්බුකුරුල්ලා *Acrocephalus stentoreus*

Family LOCUSTELLIDAE **GRASSHOPPER WARBLERS, GRASSBIRDS AND ALLIES**

355. **Pallas's Grasshopper Warbler** පළගැටිහම්බුකුරුල්ලා *Helopsaltes certhiola*
356. **Lanceolated Warbler** ළැමඉරි හම්බුකුරුල්ලා *Locustella lanceolata*
357. **Common Grasshopper Warbler** ලාවන් පළගැටිහම්බුකුරුල්ලා *Locustella naevia*
358. **Broad-tailed Grassbird** පළල්පෙඳ හම්බුකුරුල්ලා *Schoenicola platyurus*
359. **Sri Lanka Bush Warbler** කඳු හම්බුකුරුල්ලා *Elaphrornis palliseri* E

Family HIRUNDINIDAE **SWALLOWS**

360. **Sand Martin** ඉවුරු වැහිලිහිණියා *Riparia riparia*
361. **Dusky Crag Martin** අඳුරු වැහිලිහිණියා *Ptyonoprogne concolor*
362. **Hill Swallow** කඳු වැහිලිහිණියා *Hirundo domicola*
363. **Wire-tailed Swallow** කුරුපෙඳ වැහිලිහිණියා *Hirundo smithii*
364. **Barn Swallow** වැහිලිහිණියා *Hirundo rustica*
365. **Western House Martin** සුදුකටී වැහිලිහිණියා *Delichon urbicum*
366. **Sri Lanka Swallow** බඩරතු වැහිලිහිණියා *Cecropis hyperythra* E
367. **Eastern Red-rumped Swallow** ඉරි වැහිලිහිණියා *Cecropis daurica*
368. **Streak-throated Swallow** ගිරි වැහිලිහිණියා *Petrochelidon fluvicola*

Family PHYLLOSCOPIDAE **LEAF WARBLERS**

369. **Dusky Warbler** තදඳුඹුරු හම්බුකුරුල්ලා *Phylloscopus fuscatus*
370. **Green Warbler** කොළ හම්බුකුරුල්ලා *Phylloscopus nitidus*
371. **Greenish Warbler** පලාවන් හම්බුකුරුල්ලා *Phylloscopus trochiloides*
372. **Large-billed Leaf Warbler** මහතුඩු හම්බුකුරුල්ලා *Phylloscopus magnirostris*
373. **Western Crowned Leaf Warbler** මුදුන්ඉරි හම්බුකුරුල්ලා *Phylloscopus occipitalis*

Family PYCNONOTIDAE **BULBULS**

374. **Black-capped Bulbul** හිසකලු කොණ්ඩයා *Rubigula melanictera* E
375. **White-browed Bulbul** ගලුගුඩු කොණ්ඩයා *Pycnonotus luteolus*
376. **Yellow-eared Bulbul** ගුරු කොණ්ඩයා *Pycnonotus penicillatus* E
377. **Red-vented Bulbul** කොණ්ඩකුරුල්ලා *Pycnonotus cafer*
378. **Yellow-browed Bulbul** කහ කොණ්ඩයා *Acritillas indica*
379. **Square-tailed Bulbul** කලු කොණ්ඩයා *Hypsipetes ganeesa*

Family SYLVIIDAE **SYLVIID WARBLERS AND ALLIES**

380. **Lesser Whitethroat** දුඹුරු හම්බුකුරුල්ලා *Curruca curruca*
   **Small Whitethroat** හීන් හම්බුකුරුල්ලා *C. c. minula*
   **Hume's Whitethroat** අළු හම්බුකුරුල්ලා *C. c. althaea*

Family PARADOXORNITHIDAE **PARROTBILLS AND ALLIES**

381. **Yellow-eyed Babbler** ඇස්කහ දෙමළිච්චා *Chrysomma sinense*

Family ZOSTEROPIDAE **WHITE-EYES, YUHINAS AND ALLIES**

382. **Sri Lanka White-eye** කඳු මල්කුරුල්ලා *Zosterops ceylonensis* E
383. **Indian White-eye** හීන් මල්කුරුල්ලා *Zosterops palpebrosus*

Family TIMALIIDAE **TREE BABBLERS, SCIMITAR BABBLERS AND ALLIES**

384. **Tawny-bellied Babbler** ගෙලසුදු දෙමළිච්චා *Dumetia hyperythra*
385. **Dark-fronted Babbler** හිසකලු දෙමළිච්චා *Dumetia atriceps*
386. **Sri Lanka Scimitar Babbler** දෑකැති දෙමළිච්චා *Pomatorhinus melanurus* E

Family PELLORNEIDAE **GROUND BABBLERS AND ALLIES**

387. **Brown-capped Babbler** හිසදුඹුරු දෙමළිච්චා *Pellorneum fuscocapillus* E

Family LEIOTRICHIDAE **LAUGHINGTHRUSHES AND ALLIES**

388. **Ashy-headed Laughingthrush** හිසඅළු දෙමළිච්චා *Argya cinereifrons* E
389. **Orange-billed Babbler** රතු දෙමළිච්චා *Argya rufescens* E
390. **Yellow-billed Babbler** දෙමළිච්චා *Argya affinis*

Family SITTIDAE **NUTHATCHES**

391. **Velvet-fronted Nuthatch** නිල් පණුකුරුල්ල *Sitta frontalis*

Family STURNIDAE **RHABDORNIS STARLINGS AND MYNAS**

392. **Sri Lanka Hill Myna** මූකළන් සැළලිහිණියා/කන්පටියා *Gracula ptilogenys* E
393. **Southern Hill Myna** සැළලිහිණියා *Gracula indica*
394. **Rosy Starling** රෝස මයිනා *Pastor roseus*
395. **Daurian Starling** පිටදම් මයිනා *Agropsar sturninus*
396. **White-faced Starling** හිසසුදු මයිනා *Sturnornis albofrontatus* E
397. **Brahminy Starling** බ්‍රාහ්මණ මයිනා *Sturnia pagodarum*
398. **Chestnut-tailed Starling** හිසඅළු මයිනා *Sturnia malabarica*
399. **Common Myna** මයිනා *Acridotheres tristis*

Family TURDIDAE **THRUSHES AND ALLIES**

400. **Sri Lanka Thrush** පෙතිගෝමර වල්අවිච්චියා *Zoothera imbricata* E
401. **Pied Thrush** ගෝමර වල්අවිච්චියා *Geokichla wardii*
402. **Spot-winged Thrush** පුල්ලි වල්අවිච්චියා *Geokichla spiloptera* E
403. **Orange-headed Thrush** තැඹිලි වල්අවිච්චියා *Geokichla citrina*
404. **Indian Blackbird** කලුකුරුල්ලා *Turdus simillimus*
405. **Eyebrowed Thrush** බැමසුදු වල්අවිච්චියා *Turdus obscurus*

Family MUSCICAPIDAE **CHATS, OLD-WORLD FLYCATCHERS AND ALLIES**

406. **Rufous-tailed Scrub-robin** දුඹුරු බට්ටිකුරුල්ලා *Cercotrichas galactotes*
407. **Indian Robin** කලු පොල්කිච්චා *Copsychus fulicatus*
408. **Oriental Magpie-Robin** පොල්කිච්චා *Copsychus saularis*
409. **Sri Lanka Shama** වල් පොල්කිච්චා *Copsychus leggei* E
410. **Asian Brown Flycatcher** දුඹුරු මැසිමාරා *Muscicapa dauurica*
411. **Brown-breasted Flycatcher** ළයදුඹුරු මැසිමාරා *Muscicapa muttui*
412. **Blue-and-White Flycatcher** නිල්සුදු මැසිමාරා *Cyanoptila cyanomelana*
413. **Dull-blue Flycatcher** අඳුරුනිල් මැසිමාරා *Eumyias sordidus* E
414. **Blue-throated Blue Flycatcher** ගෙලනිල් මැසිමාරා *Cyornis rubeculoides*
415. **Tickell's Blue Flycatcher** ළයතැඹිලි මැසිමාරා *Cyornis tickelliae*
416. **Bluethroat** ගෙලනිල් බට්ටිකුරුල්ලා *Luscinia svecica*
417. **Sri Lanka Whistling Thrush** අරංගයා *Myophonus blighi* E
418. **Indian Blue Robin** නිල් බට්ටිකුරුල්ලා *Larvivora brunnea*
419. **Yellow-rumped Flycatcher** කහ මැසිමාරා *Ficedula zanthopygia*
420. **Kashmir Flycatcher** කාශ්මීර මැසිමාරා *Ficedula subrubra*
421. **Rufous-tailed Rock-thrush** ගුරු වල්අවිච්චියා *Monticola saxatilis*
422. **Blue Rock Thrush** නිල් වල්අවිච්චියා *Monticola solitarius*
423. **Whinchat** බැමසුදු බට්ටිකුරුල්ලා *Saxicola rubetra*
424. **Pied Bush Chat** කලු බට්ටිකුරුල්ලා *Saxicola caprata*
425. **Siberian Stonechat** හිසකලු බට්ටිකුරුල්ලා *Saxicola maurus*
426. **Desert Wheatear** වතකලු බට්ටිකුරුල්ලා *Oenanthe deserti*
427. **Pied Wheatear** හිසසුදු බට්ටිකුරුල්ලා *Oenanthe pleschanka*
428. **Northern Wheatear** ඇස්පටි බට්ටිකුරුල්ලා *Oenanthe oenanthe*
429. **Isabelline Wheatear** ළාදුඹුරු බට්ටිකුරුල්ලා *Oenanthe isabellina*

Family DICAEIDAE **FLOWERPECKERS**

430. **Thick-billed Flowerpecker** ළැමඉරි පිළලිච්චා *Pachyglossa agilis*
431. **Legge's Flowerpecker** නිල් පිළලිච්චා *Pachyglossa vincens* E
432. **Pale-billed Flowerpecker** හීන් පිළලිච්චා *Dicaeum erythrorhynchos*

Family NECTARINIIDAE **SPIDERHUNTERS AND SUNBIRDS**

433. **Purple-rumped Sunbird** මල් සූටික්කා *Leptocoma zeylonica*
434. **Purple Sunbird** දම් සූටික්කා *Cinnyris asiaticus*
435. **Loten's Sunbird** රත් සූටික්කා *Cinnyris lotenius*

Family CHLOROPSEIDAE **LEAFBIRDS**

436. **Jerdon's Leafbird** ගෙළනිල් ගිරාකුරුල්ලා *Chloropsis jerdoni*
437. **Golden-fronted Leafbird** රන්නළල් ගිරාකුරුල්ලා *Chloropsis aurifrons*

Family IRENIDAE **FAIRY-BLUEBIRDS**

438. **Asian Fairy-bluebird** නිල් රාජකුරුල්ලා *Irena puella*

Family PLOCEIDAE **WEAVERS AND ALLIES**

439. **Streaked Weaver** පන් වඩුකුරුල්ලා *Ploceus manyar*
440. **Baya Weaver** රුක් වඩුකුරුල්ලා *Ploceus philippinus*

Family ESTRILDIDAE **MUNIAS, PARROTFINCHES, WAXBILLS AND ALLIES**

441. **Indian Silverbill** ගෙලසුදු වීකුරුල්ලා *Euodice malabarica*
442. **Scaly-breasted Munia** පුල්ලි වීකුරුල්ලා *Lonchura punctulata*
443. **Black-throated Munia** කඳු වීකුරුල්ලා *Lonchura kelaarti*
444. **White-rumped Munia** පිටසුදු වීකුරුල්ලා *Lonchura striata*
445. **Tricoloured Munia** හිසකලු වීකුරුල්ලා *Lonchura malacca*

Family PASSERIDAE **SNOWFINCHES AND OLD WORLD SPARROWS**

446. **Yellow-throated Sparrow** ගෙලකහ ගේකුරුල්ලා *Gymnoris xanthocollis*
447. **House Sparrow** ගේකුරුල්ලා *Passer domesticus*

Family MOTACILLIDAE **WAGTAILS AND PIPITS**

448. **Forest Wagtail** මූකලන් හැලපෙන්දා *Dendronanthus indicus*
449. **Grey Wagtail** අළු හැලපෙන්දා *Motacilla cinerea*
450. **Western Yellow Wagtail** කහ හැලපෙන්දා *Motacilla flava*
451. **Citrine Wagtail** හිසකහ හැලපෙන්දා *Motacilla citreola*
452. **White-browed Wagtail** මහ හැලපෙන්දා *Motacilla maderaspatensis*
453. **White Wagtail** සුදු හැලපෙන්දා *Motacilla alba*
454. **Blyth's Pipit** චීන ගොමරිට්ටා *Anthus godlewskii*
455. **Tawny Pipit** ලාවන් ගොමරිට්ටා *Anthus campestris*
456. **Richard's Pipit** උස් ගොමරිට්ටා *Anthus richardi*
457. **Paddyfield Pipit** ගොමරිට්ටා *Anthus rufulus*
458. **Olive-backed Pipit** රුක් ගොමරිට්ටා *Anthus hodgsoni*
459. **Red-throated Pipit** ගෙලරතු ගොමරිට්ටා *Anthus cervinus*

Family FRINGILLIDAE **FINCHES, EUPHONIAS AND ALLIES**

460. **Common Rosefinch** රෝසකුරුල්ලා *Carpodacus erythrinus*

Family EMBERIZIDAE **OLD WORLD BUNTINGS**

461. **Black-headed Bunting** හිසකලු තෘණකුරුල්ලා *Emberiza melanocephala*
462. **Red-headed Bunting** හිසරතු තෘණකුරුල්ලා *Emberiza bruniceps*
463. **Grey-necked Bunting** හිසඅළු තෘණකුරුල්ලා *Emberiza buchanani*

**ආශ්‍රිත ග්‍රන්ථ:**

ගුණවර්ධන, කිත්සිරි (2001) සියොත් විත්ති. ලංකා කුරුලු සංගමය, කොළඹ.

පෙරේරා, ඩී. ජේ. ඒ. සහ කොටගම, එස්. ඩබ්ලිව්. (1983) ශ්‍රී ලංකාවේ කුරුල්ලන් සඳහා ක්‍රමානුකූල නාමාවලිය A Systematic Nomenclature for the Birds of Sri Lanka. ක්ෂේත්‍ර පක්ෂි විද්‍යා අධ්‍යයන කවය ශ්‍රී ලංකාව, කොළඹ සහ සීමාසහිත තිසර ප්‍රකාශකයෝ, දෙහිවල.

රණසිංහ, ඩග්ලස් සහ ද සිල්වා, ටී. එස්. යූ. (1978) ශ්‍රී ලංකා කුරුලු නාමාවලිය/Sri Lanka Avifaunal List – (Sinhala-English). ලංකා වනසත්ව සහ ස්වභාව ආරක්ෂක සංගමය හා ලංකා කුරුලු සංගමය, කොළඹ.

රණසිංහ, ඩග්ලස් සහ ද සිල්වා, ටී. එස්. යූ. (1994) ශ්‍රී ලංකා කුරුලු නාමාවලිය/Sri Lanka Avifaunal List – (Sinhala-English). [යාවත්කාලීන කළ නාමාවලිය]. ශ්‍රී ලංකා වනසත්ව සහ ස්වභාව ආරක්ෂක සංගමය හා ලංකා කුරුලු සංගමය, කොළඹ.

AviList Core Team. 2026. AviList: The Global Avian Checklist, v2025b. https://doi.org/10.2173/avilist.v2025b

Henry, G.M. (1955) *A Guide to the birds of Ceylon*. Oxford University Press, Oxford.

Henry, G.M. (1998) *A Guide to the*. 3rd revised and enlarged edition. K.V.G. De Silva & Sons, Kandy and Oxford University Press, Oxford.

Legge, W.V. (1880) *A History of the Birds of Ceylon*. 2 Vols., 1983 2nd ed. Tisara Prakasakayo Limited, Dehiwala.

Phillips, W.W.A. (1953) *A (1952) revised Checklist of the Birds of Ceylon*. Natural History Series (Zoology). The National Museums of Ceylon, Colombo.

Phillips, W.W.A. (1976) 1975 *Annotated Checklist of the Birds of Ceylon (Sri Lanka)*. Wildlife and Nature Protection Society of Ceylon, Colombo and Ceylon Bird Club, Colombo.

Phillips, W.W.A. (1978) *Annotated Checklist of the Birds of Ceylon (Sri Lanka)*. Wildlife and Nature Protection Society of Sri Lanka, Colombo and Ceylon Bird Club, Colombo.

Warakagoda, D., and Warakagoda, H. (2026) (in prep.) *Checklist of the Birds of Sri Lanka*. http://www.ceylonbirdclub.org Ceylon Bird Club.

Wijesinghe: D.P. (1994) *Checklist of the Birds of Sri Lanka*. CBCN Special Publications Series No 2. Ceylon Bird Club, Colombo.

**© ලංකා කුරුලු සංගමය, 2026**